www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ටෙඩ් ග්‍රාන්ට්: බ්‍රිතාන්‍ය මිලිටන්ට් ප්‍රවනතාවයේ හිටපු නායකයා පිලිබඳ දේශපාලන ඇගයීමක්

## දෙවන කොටස

## Ted Grant: A political appraisal of the former leader of the British Militant Tendency Part 2

**ඈන් ටැල්බට් විසිනි**

**2006 සැප්තැම්බර් 28**

*මෙය කොටස් දෙකකින් යුත් මරනය පිලිබඳ සටහනේ අවසන් කොටසයි.*

ටෙඩ් ග්‍රාන්ට් පැබ්ලෝවාදී සංශෝධනවාදයට මූලික දායකත්වයක් සපයා ඇතියැයි පැවසිය හැකිනම්, එය නිර්ධන පන්තික බොනපාට්වාදය පිලිබඳ ඔහුගේ න්‍යාය ඇසුරිනි. ග්‍රාන්ට් අර්ථ දැක්වූ ලෙසට, ස්ටැලින්වාදී නිලධරය නිර්ධන පන්තියේ අනියම් නියෝජිතයන් බැවින්, ඔහුට අනුව, නැගෙනහිර යුරෝපයේ සමාජ පරිවර්තනයක් කරගෙන යාමට හැකියාව තිබිනි.

ග්‍රාන්ට් මෙය ගෙනහැර දැක්වූයේ සෝවියට් සංගමය සම්බන්ධව ට්‍රොට්ස්කිගේ විශ්ලේෂනයේ වර්ධනයක් ලෙසට ය. මෙය ඇත්තට ම සත්‍යයට බොහෝ දුරස් වූවකි. ස්ටැලින්වාදය බොනපාට්වාදයේ රූපාකාරයක් ලෙස හඳුනාගත් ට්‍රොට්ස්කි සෝවියට් තර්මිඩෝරය ගැන සඳහන් කල නමුදු යොදාගත් වචනවලින් තමා අදහස් කලේ කුමක්ද යන්නත් සෝවියට් බොනපාට්වාදය සහ ප්‍රන්ස විප්ලවය හා බැඳුනු බොනපාට්වාදයේ පැරනි රූපාකාරයන් අතර ඇති වෙනස සම්බන්ධවත් ස්ථිර ලෙසට ම සැලකිලිමත් විය.

1794 දී තර්මිඩෝර් මතින් රොබස්පියර් පෙරලා දැමුනු අතර මහජනතාවගේ දේපල සහිත කොටස්වල ආධාරය මත රැඳුනු තුන්වන රාජ්‍යයේ වඩා කොන්සර්වැටිව්වාදී ජැකොබින්වරුන් වෙත බලය මාරුවුනි. 1799 දී ප්‍රන්ස ධනපතීන්ගේ වඩා ධනවත්ම කොටස වෙනුවෙන් 18 බ්‍රූමර් කුමන්ත්‍රනයකින් බොනපාට් බලය අල්ලා ගත්තේය. නමුත් මෙම රාජ්‍යයන් කිසිවක් දේපල සම්බන්ධතාවල සිදුවන වැදගත් වෙනස්වීමට තර්ජනය නොකලේ ය. ඔවුහු ධනපති දේපලවල ආරක්ෂකයෝ ලෙස පෙනී සිටියා පමනක් නොව ඒ වන විටත් යුරෝපය පුරා බලය දරා සිටි වැඩවසම් පරමවාදී (absolutist) ආන්ඩු සමග ගැලපූ විට එක්තරා අන්දමක ප්‍රගතිශීලී ගුනාංගයක් රඳවා ගත්තෝය.

1924 න් පසුව සෝවියට් සංගමයේ බලය විප්ලවවාදී පෙරටු බලඇනියේ දෑත්වලින් නිලධරයේ සහ කම්කරු පන්තියේ වඩා කොන්සර්වැටිව්වාදී ස්තරවලට මාරුවූ ආකාරය සංසන්දනය කල හැකිය. නමුත්, නැපෝලියන්හට නැවත වැඩවසම්වාදයට හැරිය නොහැකි වූ අතර වැඩවසම් රාජ්‍යයේ අවහිරවලින් නිදහස ලැබූ ධනවාදය තමන්ගේ ම ඒකමතියක් වර්ධනය කරගත් නිසා සෝවියට් සංගමයේ තත්වයට වඩා එය බොහෝ වෙනස් විය.

සමාජවාදය ධනවාදය මෙන් වර්ධනයක් අත්කරගන්නේ නැත. එය සවිඥානිකව ගොඩනැගිය යුතුය. එනයින් බොනපාට් ප්‍රන්සයේදී ධනපති විප්ලවය නිරාවරනය නොකල ආකාරයට ස්ටැලින්වාදී රාජ්‍යය නිර්ධන පන්තික විප්ලවය අනතුරුවලට නිරාවරනය කලේ ය. තමන්ගේ සහ ක්‍රෙම්ලින් නිලධරයේ ස්ථාවරය මත යැපුන ජාතිකවාදී දේපල සම්බන්ධතා ආරක්ෂා කිරීමට ස්ටැලින් අනුග්‍රහය දැක්වූයේ නමුත් සෝවියට් සංගමයේ විප්ලවවාදී පෙරටු බලඇනියේ පුනර්ජීවය වලක්වාලීම සඳහා නැවත නැවතත් අන්තර්ජාතිකව විප්ලවවාදී බලවේගවල හුස්ම හිරකල ස්ටැලින් ප්‍රමුඛ නිලධරය එම දේපල සම්බන්ධතා මූලිකව ම අවතක්සේරු කල අතර ධනවාදයේ පුනරුත්ථාපනය සඳහා වැඩ කටයුතු සූදානම් කලේ ය.

කෙසේ වුවද, ග්‍රාන්ට්හට නම් බොනපාට්වාදය බොනපාට්වාදය ම විය. 18 වන ශතවර්ෂයේදී වැඩවසම්වාදය මුලිනුපුටා දැමීමට නැපෝලියන් බොනපාට් හට හැකිවූයේ නම් විසිවන ශතවර්ෂයේදී ස්ටැලින්හට ධනවාදය මුලිනුපුටා දැමිය හැකිය යන්න ඔහුගේ කරුනු දැක්වීම විය. එම නිසා දෙවන ලෝක යුද්ධයෙන් පසුව, සෝවියට් රතු හමුදාව නැගෙනහිර යුරෝපයේ වාඩි ලාගත් විට එම රාජ්‍යයන් මොස්කව් පාලනයට නතුවූ නිසා නැගෙනහිර යුරෝපයේ රටවල් 'කම්කරු රාජ්‍ය' බව ග්‍රාන්ට් ප්‍රකාශ කලේ ය.

සියලු ම පැබ්ලෝවාදීන්ට මෙන්ම ග්‍රාන්ට්හට ද ස්ටැලින්වාදය බලයේ සිටීම කම්කරු රාජ්‍යයකට සමාන විය. ඔවුහු මෙලෙස ස්ටැලින්වාදය වැදගත් ස්ථිර විප්ලවවාදී මෙහෙයුමක් ලෙසට පින්තාරු කලෝය. එහි එකම ගැටලුව ලෙසට ඔවුන් හඳුනාගත්තේ පිරිසිදු කම්කරු ප්‍රජාතන්ත්‍රවාදය නොතිබීම පමනි. ප්‍රතිවිප්ලවය සහ ධනවාදය පුනරුත්ථාපනය සම්බන්ධ අනතුරු ඔවුහු නොදුටුවෝය.

ග්‍රාන්ට් එම තර්කයම ටිටෝ යටතේ යුගෝස්ලාවියාවටත් මාඕ යටතේ චීනයටත් ආදේශ කලේ ය. පසුකාලීනව මේ රටවල් සමග කියුබාව, බුරුමය, සිරියාව, කාම්බෝජය, වියට්නාමය, ඇංගෝලාව, මොසැම්බික්, සහ ඉතියෝපියාව ඇතුලත්ව ඉතා දිගු ලැයිස්තුවක් ම 'නිර්ධන පන්තික බොනපාට්වාදයේ' උදාහරන ලෙස ගෙනහැර දක්වමින් එම රටවල්වලට තම රටවල නිෂ්පාදන බලවේග වර්ධනය කිරීමට හැකියාව පවතින බවත් ඒවා ප්‍රගතිශීලී ලෙස සැලකිය යුතු බවටත් නියමයක් ගොඩනැගුවේ ය.

ට්‍රොට්ස්කි නිලධරය සමාන කලේ තමන්ගේ ම ස්වාධීන ජීවිතයක් ගොඩනගා ගත නොහැකි නමුත් විශාලව වැඩී ජීව ශරීරය ම විනාශ කර දමන අසාමාන්‍ය ගැටිත්තකට ය (tumour). කෙසේ වුවද, ග්‍රාන්ට් සිය මේරූ දේශපාලන ජීවිතය පදනම් කරනු ලැබුවේ නිලධරය මෙම ස්වාධීන කුසලතාවය වර්ධනය කර තිබේය යන ප්‍රතිඡ්ඨාව මතය.

ග්‍රාන්ට්ට අනුව, මාක්ස්වාදයේ නාමයෙන් මනුෂ්‍ය වර්ගයාගේ පරම්පරාවල් ආඥාදායක රාජ්‍යයන් තුල වහල්භාවයේ සහ සිර කඳවුරු තුල දඬුවම් ලබාදීමට අපෝහක භෞතිකවාදයේ නීති විසින් නියෝග කෙරී ඇත. සෝවියට් සංගමය දියකර හරින විට පවා, 1991 අගෝස්තු කුමන්ත්‍රනය සමාජවාදය ආරක්ෂා කරන්නට නිලධරය තවමත් උත්සාහ ගන්නා බව පෙන්නුම් කරන්නේ යැයි ග්‍රාන්ට් ප්‍රකාශ කලේ ය.

සෝවියට් සංගමය පිරිහීමේ ක්‍රියාවලිය අනන්තයටම පැතිර යා නොහැකිය. ස්ටැලින්වාදී නිලධරය දේශපාලන විප්ලවයක් මගින් මුලිනුපුටා නොදැමුනා නම් සමහර අවස්ථාවකදී ට්‍රොට්ස්කි විසින් පිරිහීමේ ක්‍රියාවලිය හඳුනාගත් ලෙස ධනවාදය පුනස්ථාපනය දක්වා ඉදිරියට යනු ඇත.

තම ඉදිරි දර්ශනය ඉතිහාසය මගින් ප්‍රතික්ෂේප කර ඇති බව දැකීමට තරම් කාලයක් ග්‍රාන්ට් ජීවත් වූයේ ය. දෙවන ලෝක යුද්ධයෙන් පසුව අසත්‍ය බවට ඔප්පු කෙරේ යැයි ග්‍රාන්ට් පැවසූ ට්‍රොට්ස්කිගේ ඉදිරි දර්ශනය සහමුලින්ම නිදොස් බව ඔප්පු කර ඇත.

සෝවියට් සංගමය සම්බන්ධව හෝ ව්‍යාපාරික දක්ෂිනාංශික නව ලිබරල් පක්ෂයක් ලෙසට කම්කරු පක්ෂයේ පිරිහීම හෝ වැනි තමන්වටා ඇති වෙනස්වීම් ගැන අනවධානයෙන් යුක්තව ග්‍රාන්ට් ප්‍රමුදිතව ඉදිරියට ගියේ ය. මාක්ස්වාදය ගැන ඔහුගේ ඇති අනවබෝධය නිසා, මේ ලෙසට ඔහුගේ ම දේශපාලන මාවතක දිගටම ගමන්කරන්නට ඔහුට හැකිවිය. මාක්ස්වාදය ලෙසට ඔහු සැලකුවේ ආගමානුකූල ලැදියාව සමග ගැලතුනු චිරන්තන දෘෂ්ටීන් සමූහයකි. මූලධර්මවාදී දේශකවරු බයිබලය උපුටා දක්වන ආකාරයට මාක්ස්වාදයේ සම්භාව්‍ය නිර්මාන ඔහුට අවශ්‍යවූයේ ශුද්ධ වූ වගන්ති ලෙස උපුටා දක්වන්නට ය.

## ග්‍රාන්ට් සහ වැනිසියුලාව

ඇලන් වුඩ්ස් සමග ග්‍රාන්ට් ලියූ "කැරැල්ලට හේතුව" *Reason in Revolt* නම් පොතෙහි පිටපතක් තමන්ගේ ඇඳේ පසෙකින් තබා ගන්නා බවට වැනිසියුලාවේ හියුගෝ චාවෙස් ප්‍රකාශ කිරීමත් සමග ලතින් ඇමරිකාවේ අවතාර ස්වරූපයේ මතු ජීවිතයක් ලැබීම ග්‍රාන්ට්ගේ දෘෂ්ටිවාදයේ එක් අද්භූත අතුරුපලයක් වේ. එය, මාක්ස්වාදී දර්ශනයත් නූතන විද්‍යාව නැවත පිරික්සුමක් සමග ධනවාදී අර්බුදයේ විශ්ලේෂනයක් එකට එකතුකොට නිම කල වැල්වටාරම් සහිත නිර්මානයකි. විද්‍යාව සම්බන්ධව කිසිදු පුහුනුවක් සහ පලපුරුද්දක් නොමැති පදනම මත සිට "අපෝහක භෞතිකවාදී ක්‍රමය යොදා ගනිමින්" නූතන විද්‍යාව නිවැරදි කිරීමට ග්‍රාන්ට් සහ වුඩ්ස්, තමන්ම භාර ගනිති. මෙම පොතෙහි විශේෂ ලක්ෂනය පැහැදිලි කරනවා නම්, කලු ආගාධ (Black Holes) පැවතීමේ හැකියාව ඔවුන් ප්‍රතික්ෂෙප කරන්නේ එම සංසිද්ධිය අපෝහක භෞතිකවාදය සමග අනුරූප නොවන නිසා ය. සිද්ධාන්තමය හේතු මත සහ නිරීක්ෂන දත්ත මගින් තහවුරු කෙරුනු, තාරකා විද්‍යාඥයන් විසින් බහුලව පිලිගැනුනු, මහා පිපිරුමේ සිද්ධාන්තය (Big Bang Theory) "ගුඪ සහ රහස් සමීකරන" මත පිහිට වූ " ගුප්ත විශ්ලේෂනයක්" ලෙස ඔවුහු බැහැර කරති.

අසීරු විද්‍යාත්මක කාර්යයක අවශ්‍යතාවයක් නොමැතිව ස්වභාවධර්මයේ රහස් හෙලිකරගතහැකි සැනෙකින් ප්‍රයෝජනයට ගතහැකි විශ්වයට ඇති මැජික් යතුරක් ලෙස ග්‍රාන්ට් සහ වුඩ්ස්, අපෝහක භෞතිකවාදය ඉදිරිපත් කරති. හේතු දැක්වීමට මෙම ක්‍රමය උපයෝගී කරගන්නා අයට අපෝහක භෞතිකවාදයේ අඩංගු වන්නේ තමුන් ඒ පිලිබඳව කියන දේ මිස අන් කිසිවක් නොවේ. මාක්ස්වාදයේ ගති ලක්ෂන වන ස්ථිරසාර යථාර්ථය නැවත නැවතත් විමර්ශනය හා විචාරය කරන ක්‍රියා පිලිවෙල ඔවුහු මග හරින බැවින් ඔවුන්ගේ අවබෝධය පලපුරුද්ද සමග ගැටෙන්නට කිසි දිනෙක බලකෙරී නැත. එය වාග් ශෛලියේ එක්තරා සමාන කමක් හැරුන විට මාක්ස්වාදය සමග කිසිදු පොදු බවක් නැති සම්පූර්නයෙන් ම තමන්ට ම සේවය සපයා ගන්නා මනෝබද්ධ ක්‍රමයකි. මාක්ස්වාදී වචන පාවිච්චියේදී ග්‍රාන්ට් සහ වුඩ්ස් දක්ෂ වන නමුත් විද්‍යාත්මක

ආකාරයකට වඩා ඔවුන් එය කරන්නේ සම්පූර්නයෙන්ම අලංකාරොක්තිය සඳහා පමනි. තම නිෂ්පාදනයේ ඇති නව අද්භූත විද්‍යාත්මක කොටස පුදුම දේ සිදුකරන බව පවසන ප්‍රචාරක සමාගමක් ලෙසට ම විද්‍යාත්මක හඬ දෙන භාෂාවක් පාවිච්චි කරයි.

ඔවුන්ගේ දර්ශනවාදී ක්‍රමය සහ අවස්ථාවාදී දේශපාලනය අතර සම්බන්ධතාවය මෙමගින් පැහැදිලි කරන බැවින්, "කැරැල්ලට හේතුව" පොතට සෘජු දේශපාලන අදාලත්වයක් ඇති නිසා, එය කෙටියෙන් නමුත් වැඩිදුරට පරීක්ෂා කිරීම වටී.

වුඩ්ස්ට අනුව, පොතෙහි ගිබ්ස් ශක්තිය සඳහන්ව ඇති කොටස චාවේස් විශේෂිතව සඳහන් කර ඇත. පොතෙහි එක් කර්තෘ කෙනෙක් ලෙසට ඔහුව චාවේස්ට හඳුන්වා දෙන විට ජනාධිපති ඔහුට සුභ පැතූ අතර තමන්ගේ සියලු ම ආධාරකරුවන්ට එම පොත රෙකමදාරු කල බව වුඩ්ස් විස්තර කරයි. චාවේස් කියූ දේ වුඩ්ස් සිහියට නංවන්නේ "ඔබ දන්නවා ද මම එම පොත මගේ ඇඳේ පසෙකින් තබාගෙන තියනවා. මම එය සෑම රෑයකම කියවනවා. මම 'විප්ලවයේ අනුක ක්‍රියාවලිය' පරිච්ඡේදය තරම් දුරට කියවා තිබෙනවා. ඔබ දන්නවා ද ගිබ්ස්ගේ ශක්තිය ගැන ලියූ තැන" ගිබ්ස්ගේ ශක්තිය සම්බන්ධව ඇති කොටස ගැන චාවේස් බොහෝ විස්මයට පත්වී ඇත. "ඔහුගේ කතාවල එකදිගට ම ඔහු එය උපුටා දක්වනවා ගිබ්ස් මහත්මයා කවදාවත් මේ තරම් ජනප්‍රිය නැතිව ඇති."[8]

19 වන ශත වර්ෂයේ ගනිතය පිලිබඳ ඇමරිකානු භෞතික විද්‍යාඥයා වන මහාචාර්ය ජේ. විලාඩ් ගිබ්ස් එෆ්.ආර්.එස්, සංඛ්‍යානමය යාන්ත්‍රවිද්‍යාවට සැපයූ දායකත්වය නිසා චිර ප්‍රසිද්ධ වන අතර ග්‍රාන්ට්ගේ හෝ වුඩ්ස්ගේ හෝ චාවේස්ගේ අවධානයට ලක්වන්නට පෙර සිට ම ඉතා ජනප්‍රිය ය. හයිඩ්‍රජන් ඉන්ධන කෝෂ ගැන ඉගෙනගත් ඕනෑ ම උසස් පාසල් ශිෂ්‍යයෙක් ඔහුගේ නම අසා ඇති අතර ඔහු විසින් වර්ධනය කරන ලද සමීකරන උපයෝගී කරගෙන ඇත. නිදහස් ශක්තිය ගැන ඔහුගේ සංකල්පය යමක් ගෙනයන්නට අවශ්‍ය ශක්ති ප්‍රමානය හෝ රසායනික ප්‍රතික්‍රියාවකින් ලබාගත හැකි ශක්ති ප්‍රමානය ගනිතයානුකූලව විස්තර කරයි. කෙසේවුවද, හෙල්ම්හෝල්ට්ස්ගේ ශක්තිය හෝ සත්තකින්ම බෝල්ට්ස්මන්ගේ නියතය වැනි තාපගතික විද්‍යා ක්ෂේත්‍රයේ අනෙකුත් කොටස්වලට වඩා ගිබ්ස්ගේ ශක්තිය පමනක් දේශපාලන පිලිගැනීම සඳහා තෝරා ගතයුත්තේ ඇයිදැයි පැවසීමට ඔවුනට බලකෙරේ.

ග්‍රාන්ට් සහ වුඩ්ස්ගේ ග්‍රන්ථය දෙසට හැරීමෙන් රසායනික ප්‍රතික්‍රියාවක තාපගතික විද්‍යා ගුන හා සමාජ-දේශපාලනික ක්‍රියාවලි අතර සම්බන්ධතාව ක්ෂනිකව පහදා නොදේ. අපට පවසන ලෙසට ගිබ්ස් ශක්තියේ භූමිකාව සහ 'විප්ලවයේ අනුක ක්‍රියාවලිය' නමින් ට්‍රොට්ස්කි අදහස් කල දේ අතර සංසන්දනයක් එහි ඇත. ගිබ්ස් ශක්තිය ගැන කරුනු දක්වන්නට ඔහුට අවස්ථාව නොතිබුනා හෝ සමාජ හා දේශපාලන ක්‍රියාවලිය රසායනික ක්‍රියාවලිය සමග සමාන කරන්නට උපමිතියට (analogy) ඔහු බල නොකෙරුනේ වුවද, ට්‍රොට්ස්කිගේ "රුසියන් විප්ලවයේ ඉතිහාසය" නම් ග්‍රන්ථයේ එම වගන්තිය ඔහු ඇත්තටම පාවිච්චි කරයි.

රසායන විද්‍යාවේ හා දේශපාලනයේ සම්පූර්නයෙන්ම වෙනස් වූ සංදර්භයක් තුල සමාන ක්‍රියාවලීන් දෙකක් අතරේ විස්තර දක්වන උපමිතියක් ට්‍රොට්ස්කි සලකුනු කරමින් සිටියේ ය. ග්‍රාන්ට් සහ වුඩ්ස් මුළුමනින්ම අවලංගු වන සමානකමක් ගෙන හැර දක්වති. රසායන විද්‍යාවේදී ප්‍රතික්‍රියාවේ අන්තර්ගත කොටස් තමන් කරන දේ සම්බන්ධව කිසිසේත් ම සවිඥානික නොවේ. දේශපාලනයේදී ඔවුන් එසේ වන අතර සමාජවාදී විප්ලවයේදී ඔවන් එසේ විය යුතුමය.

රුසියානු විප්ලවයට ඉඩ සැලසුන වෛෂයික හා මනෝමූලික තත්වයන් ගැන ප්‍රත්‍යක්ෂ විශ්ලේෂනයක් ට්‍රොට්ස්කි විසින් ඉදිරිපත් කරන "රුසියන් විප්ලවයේ ඉතිහාසය" ග්‍රන්ථය, ඓතිහාසික භෞතිකවාදය දේශපාලන සංසිද්ධියකට යෙදීම පිලිබඳ සම්භාව්‍ය උදාහරනයකි. රුසියානු සමාජයේ විවිධ පන්ති තුල සහ පන්තීන්හි විවිධ ස්තර තුල සිදුවන දේශපාලන සවිඥානිකබවේ වෙනස්වීම් ඔහු සලකුනු කරන අතර එම වෙනස්වීම්වලට බලපෑම් කල සාධක හඳුනාගනියි. කම්කරුවන්, සොල්දාදුවන්, නැවියන්, සහ ගැමියන්ගේ පුද්ගලික සවිඥානික බව හා පන්තීන්ගේ සමාජ සවිඥානික බව අතර සම්බන්ධතාවය ඔහු හෙලිදරව් කරයි.

ග්‍රාන්ට් සහ වුඩ්ස් අපට එවැනි ප්‍රත්‍යක්ෂ යමක් නොදේ. ඉතිහාසයේ තනි පුද්ගල භූමිකාව සහ පුද්ගලයා සිය භූමිකාව රගන කොටස හා ඉතිහාසයේ වාස්තවික ආර්ථික තත්වයන් අතර සම්බන්ධතාව ගැන සඳහන් වන කොටසේ ගිබ්ස් ශක්තිය ගැන ඔවුන්ගේ සාකච්ඡාව ඉදිරිපත් කෙරේ. "එක්තරා අවස්ථාවකදී එක් පුද්ගලයෙකුට පවා සම්පූර්නයෙන්ම තීරනාත්මක භූමිකාවක් රගපෑ හැකියැයි" ඔවුහු අපට කියති. ලෙනින් හා ට්‍රොට්ස්කි නොසිටියා නම් රුසියානු විප්ලවයක් සිදුවිය නොහැකි බව ඔවුහු නිවැරදිව ගෙන හැර දක්වති. "සූදානම් වීමේ ප්‍රමානය, පෙර දැක්ම, පුද්ගල ධෛර්යය, සහ නායකයන්ගේ හැකියාව" මත විප්ලවයක සාර්ථක-අසාර්ථකභාවය රඳා පවතී.

සාමාන්‍ය හා මුලුමනින්ම සංක්ෂිප්ත ලෙස සැලකූ විට මෙය සත්‍යයකි. කිසියම් ඓතිහාසික තත්වයකදී නායකයන්හට මෙවැනි ගුනාංග අවශ්‍ය වේ. නමුත් සමාජවාදී විප්ලවයක නායකයෝ කල යුතු විශේෂිත වූ සූදානම් වීම් මොනවා ද ඔවුහු පෙන්නුම් කල යුත්තේ කුමන පෙර දැක්මක් ද ඔවුහු ධෛර්යය සම්පන්න විය

යුත්තේ කුමක් අරබයා ද ඔවුනට අවශ්‍ය කරන පුද්ගල හැකියාවන් මොනවා ද සමාජවාදී විප්ලවයක නායකයන් වෛෂයික කම්කරු පන්තියේ ඓතිහාසිකව නිර්මිතවූ අයිතීන් සවිඥානිකව ආවර්ජනය කල යුතු බව මාක්ස්වාදීහු සැමවිට ම තරයේ පවසා තිබුනහ. නමුත් ග්‍රාන්ට් සහ වුඩ්ස් එසේ නොවේ. නායකයෙකුගේ පන්ති ස්වභාවය සැලකිල්ලට ගත යුතු නැත. ඔහු වාස්තවික විප්ලවවාදී ව්‍යාපාරයන්හි අවිඥානික හෝ අර්ධ-සවිඥානික වාහකය බවට පත්වෙයි.

-----------------------

චාවේස්, ග්‍රාන්ට් සහ වුඩ්ස් ගේ ග්‍රන්ථයේ මෙම කොටසට උද්යෝගීමත් ලෙස අනුකූලතා දැක්වූයේ මෙම හේතුව නිසා ය. 'වැදගත් වන්නේ තීරනාත්මක ක්‍රියාමාර්ග ගතයුතු එඩිතර සහ නිර්භය නායකයෙකු යැ'යි ග්‍රාන්ට් සහ වුඩ්ස් පවසා සිටිති. ඔවුන්ට අනුව, ප්‍රාග්ධනයට එරෙහිව තීරනාත්මක පියවරයන් නොගන්නා තතු යටතේ පවා එය විප්ලවය සිදු කරයි.

ග්‍රාන්ට් සහ වුඩ්ස් තමන් සඳහා ලියා ඇති භූමිකාවට තමන්ව වාත්තු කරවන්නට චාවේස් ප්‍රමාද නැත. එක ප්‍රශ්නයක් ඇත. සමාජ සහ ඓතිහාසික ක්‍රියාවලීන් විද්‍යාත්මක විශ්ලේෂනයකට තමන්ව ම පුහුනු කෙරුනු සහ ජාත්‍යාන්තර කම්කරු ව්‍යාපාරය මුහුන දෙන ප්‍රශ්න හදාරන්නට මුලු ජීවිතය ම කැප කල ලෙනින් හා ට්‍රොට්ස්කි මාක්ස්වාදීන් වූ අතර මාක්ස්වාදය ගැන අබමල් රේනුවක් නොදන්නා චාවේස් හිටපු පැරෂූට් භටයෙකි. ග්‍රාන්ට් සහ වුඩ්ස් ලෙනින් හා ට්‍රොට්ස්කිට ප්‍රශංසා කරන්නන් යැයි ප්‍රකාශ කරන නමුත්, ජාත්‍යාන්තර මාක්ස්වාදී ප්‍රවනතාවයෙන් සුලු අනුශාසනා ඔහුට ලැබෙන තාක් දුරට, ඔවුන් සැලකිලිමත් වන තරමට, චාවේස් වැනි ධනපති නායකයෙකුට නිර්ධන පන්තික විප්ලවවාදියෙකුගේ භූමිකාව රඟ පෑ හැකිය. නමුත් "කැරැල්ලට හේතුව" ග්‍රන්ථයෙහි ඔවුන් පවසන ලෙසට, "අපෝහකයේදී කවදා හෝ දේවල් ඒවායේ ප්‍රතිවිරුද්ධයන්වලට වෙනස් වේ". මේ ලෙසට, අවසානයේදී, චාවේස් අරුම පුදුම ලෙස ධනපති ජාතිකවාදියෙක්ගෙන් නිර්ධන පන්තික ජාත්‍යාන්තරවාදියෙක් ලෙසට වෙනස් වන බව අපි සිතා ගත යුතු වෙමු.

8. Alan Woods, *Encounters with Hugo Chavez*, 29 April 2004. www.marxist.com/Latinam/encounters_with_hugo_chavez.html

© www.wsws.org